# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,935/5 — 1970 දෙසැම්බර් 11 වැනි සිකුරාද — 1970.12.11**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

### මිල පාලන පනත

(173 වැනි අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිළ පාලක, ඉල්ලෙ කුට්ටි ඔලිවර් කෙනත් ගාමිණී ප්‍රනාන්දු වන මම පහත සඳහන් පරිදි අණ කරමි.

1. මේ ආඥාව 1970 අංක 1 දරණ (ගල්ලැලි) මිළ පාලන ආඥාව යනුවෙන් හැඳින්විය හැකිය.

2. මේ ආඥාව මුළු දිවයිනටම අදළ විය යුතුය.

3. මෙහි වූ උපලේඛනයේ 2 වන තීරයේ ඇති එක් එක් සටහනෙහි නියම කොට දක්වා ඇති මිළ ගණන් වහාම ක්‍රියාත්මක වන පරිදි ගල්ලැල්ලක් සඳහා සිල්ලර වෙළෙන්ද අය කළ යුතු උපරිම මිළ විය යුතු අතර, ඒ උපලේඛනයේ 1 වන තීරයේ අනුරූප සටහනෙහි විස්තර කොට දක්වා ඇති ගල්ලැලි කිසිවක් ඒ මිළ ගණන්වලට වඩා ඉහළ මිළ ගණන්වලට නො විකිණිය යුතුය.

4. මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයේ නියම කොට දක්වා ඇති ගල්ලැලි යම් ප්‍රමාණයක් විකිණීම සඳහා තමා සතුව හෝ තමාගේ සලාකය යටතේ යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකු හෝ විකුණන්නකු විසින් ඒ ගල්ලැලි වර්ගවල නම්ද, උසින් අඟලකට නොඅඩු ඉලක්කම්වලින් මේ ආඥාවෙන් ඒ ගල්ලැලි සඳහා නියම කර ඇති මිළ ද යම් ගණුදෙනුකරුවෙකුට පැහැදිලිව ම පෙනෙන පරිදි දක්වෙන දැන්වීමක් ඒ ස්ථානයෙහි හෝ වාහනයෙහි ප්‍රකටව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

5. මෙහි වූ උපලේඛනයෙහි 1 වන තීරයෙහි දක්වා ඇති යම් ගල්ලැලි විකුණන සෑම තැනැත්තකු විසින්ම—

   (අ) ඒ විකිණීම කළ දිනය;

   (ආ) විකුණූ ගල්ලැලි පිළිබඳ විස්තර හා විකුණූ ගණන සහ

   (ඇ) විකුණූ ගල්ලැලි ගණන සඳහා අය කළ මිළ දක්වා තිබිය යුතු කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතුය.

6. මෙහි වූ උපලේඛනයේ 1 වන තීරයේ නියම කොට දක්වා ඇති යම් ගල්ලැලි විකිණීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින සෑම තැනැත්තකු විසින්ම, ඒ ව්‍යාපාරය කරගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ පාලක වෙත 1970 දෙසැම්බර් 30 වැනි දින දවල් 12.00 නො ඉක්මවා පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් සැපයිය යුතු ය :—

   (අ) ඒ වාර්තාව පිළියෙළ කරනු ලබන අවස්ථාවේ දී තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති ගල්ලැලි ප්‍රමාණය සහ

   (ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ සෙසු ස්ථානය.

7. මෙහි ඇති උපලේඛනයේ 2 වන තීරයෙහි නියමකර දක්වා ඇති උපරිම මිළට, ඒ ගල්ලැලි විකුණන විට ඒවා යම් දවටනයකින් ඔතා තිබේ නම් හෝ ඒවා යම් බඳුනක බහා තිබේ නම්, ඒ දවටනයේ හෝ ඒ බඳුනේ මිළ ඇතුළත්විය යුතු ය.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
නියෝජ්‍ය මිළ පාලක (විවිධ ද්‍රව්‍ය).

1970 දෙසැම්බර් මස 11 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

#### ගල්ලැලි

| විස්තරය | | එක් ගල්ලැල්ලක් සඳහා සිල්ලර වෙළෙන්දගේ උපරිම සිල්ලර මිල<br>රු. ශත |
|---|---|---|
| පහත සඳහන් ප්‍රමාණවල ගල්ලැලි— | | |
| 1. දිග අඟල් 8 කට ද පළල අඟල් 6 කට ද නො අඩු වූ ගල්ලැලි | ... | 0 95 |
| 2. දිග අඟල් 7 කට ද පළල අඟල් 5 කට ද නො අඩු වූ ගල්ලැලි | ... ... | 0 90 |
| 3. දිග අඟල් 7 කට ද පළල අඟල් 5 කට ද අඩු ගල්ලැලි | ... ... | 0 60 |

සටහන.—1. මෙහි මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නොවෙනස් මිළ ගණන් නොවේ. ඒවා වූ කලී විකිණීමේ දී නොඉක්මවිය යුතු උපරිම මිළ වන්නේය.

2. "ගල්ලැලි" යන්නට ලීයෙන් හෝ වෙනත් ද්‍රව්‍යයකින් ඉහ සෑදූ රාමුවක් ද ඇතුළත් බව අදහස් වේ. එසෙකුදු වුවත් උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් මිණුම් වලට රාමුව ඇතුළත් නොවිය යුතුය.

12—714/1


926/21 — ඉජ් 19259— 13,775 (70/12)

## මිල පාලන පනත

(173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (විවිධ ද්‍රව්‍ය) නියෝජ්‍ය මිල පාලක, ඉල්‍ල කුට්ටි ඔලිවර් කෙනත් ගාමිණී ප්‍රනාන්දු වන මම පහත සඳහන් පරිදි අණ කරමි.

1. මේ ආඥාව 1970 අංක 1 දරණ (ගණිත උපකරණ) මිල පාලන ආඥාව යනුවෙන් හැඳින්විය හැකි ය.

2. මේ ආඥාව මුළු දිවයිනටම අදාළ විය යුතුය.

3. මෙහිවූ උප ලේඛනයේ 2 වන තීරයේ ඇති එක් එක් සටහනෙහි නියම කොට දක්වා ඇති මිල ගණන් වහාම වලංගුවන පරිදි එක් ගණ උපකරණ පෙට්ටියක් සඳහා සිල්ලර වෙළෙන්දා අය කළ යුතු උපරිම සිල්ලර මිල විය යුතු අතර, ඒ උප ලේඛනයේ 1 වන තීරයේ අනුරූ සටහනෙහි විස්තර කොට දක්වා ඇති ගණිත උපකරණ පෙට්ටි කිසිවක් ඒ මිල ගණන්වලට වඩා ඉහල මිල ගණන්වලට නො විකිණි යුතුය.

4. මෙහි වූ උප ලේඛනයේ 1 වන තීරයේ නියම කොට දක්වා ඇති ගණිත උපකරණ පෙට්ටි යම් ප්‍රමාණයක් විකිණීම සඳහා තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකු හෝ විකුණන්නකු විසින් ගණිත උපකරණ පෙට්ටිවල වර්ගයද උයින් අඟලකට නො අඩු ඉලක්කම්වලින්, මේ ආඥාවෙන් ඒ ගණිත උපකරණ පෙට්ටි සඳහා නිය කර ඇති උපරිම මිල ද යම් ගනුදෙනුකරුවෙකුට පැහැදිලිවම පෙනෙන පරිදි දැක්වෙන දැන්වීමක් ඒ ස්ථානයෙහි හෝ ඒ වාහනයේ ප්‍රකටව පෙනෙන සේ ප්‍රදර්ශනය කළ යුතුය.

5. මෙහි වූ උප ලේඛනයෙහි I වන තීරයෙහි දක්වා ඇති යම් ගණිත උපකරණ පෙට්ටි විකුණන සෑම තැනැත්තකු විසින් ම—

(අ) ඒ විකිණීම කළ දිනය.

(ආ) විකුණූ ගණිත උපකරණ පෙට්ටි පිළිබඳ විස්තර හා විකුණූ ගණන හා

(ඇ) විකුණූ ගණිත උපකරණ පෙට්ටි ගණන සඳහා අය කළ මිල දක්වා තිබිය යුතු කුවිතාන්සියක් ගැනුම්කරුට දිය යුතුය.

6. මෙහි වූ උප ලේඛනයේ 1 වන තීරයෙහි නියම කොට දක්වා ඇති යම් ගණිත උපකරණ පෙට්ටි විකිණීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින සෑ තැනැත්තෙකු විසින්ම, ඒ ව්‍යාපාරය කර ගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක වෙත 1070 දෙසැම්බර් 30 වෙ දින දවල් 12.00 නො ඉක්මවා පහත සඳහන් කරුණු දක්වෙන වාර්තාවක් සැපයිය යුතුය :—

(අ) ඒ වාර්තාව පිළියෙල කරනු ලබන අවස්ථාවේදී තමා සතුව හෝ තමාගේ පාලනය යටතේ ඇති ගණිත උපකරණ පෙට්ටි ප්‍රමාණය, සහ

(ආ) ඒ තොග තබා ඇති එක් එක් ගබඩාව හෝ සෙසු ස්ථානය.

7. මෙහි ඇති උප ලේඛනයේ 2 වන තීරයෙහි නියම කර දක්වා ඇති උපරිම මිලව, ඒ ගණිත උපකරණ පෙට්ටි විකුණන විට ඒවා යම් දවටන යකින් ඔතා තිබේ නම් හෝ ඒවා යම් බඳුනක බහා තිබේ නම්, ඒ දවටනයේ හෝ ඒ බඳුනේ මිල ඇතුළත් විය යුතුය.

8. (1) මෙම නියෝගයේ කාර්යයන් සඳහා '' ගණිත උපකරණ සම්පූර්ණ කට්ටලයක් '' යනුවෙන් සරනේරු සහිත පියනකින් යුක්ත වූද, පහ සඳහන් උපකරණ ඇතුළත් වූද පෙට්ටියක් අදහස් කෙරේ :—

කවකටුවක්

බෙදන කටුවක්

කෝණ මානයක්

මිනිත චතුරශ්‍ර දෙකක්

රේඛීය පරිමාණය සටහන් කරන ලද, දිග අඟල් 6 කට නො අඩු කෝදුවක්,

කවකටුව සමග පාවිච්චි කිරීම සඳහා පැන්සලක්,

මකනයක්

(1) වන ඡෙදයෙහි දක්වා ඇති සියළුම උපකරණ අඩංගු නොවූ උපකරණ පෙට්ටියක් සම්පූර්ණ උපකරණ කට්ටලයක් ලෙස නො සැළකෙ අතර එවැනි අසම්පූර්ණ උපකරණ කට්ටලයක මිල සම්පූර්ණ ගණිත උපකරණ කට්ටලයක් සඳහා මෙම නියෝගයෙහි දක්වා ඇති උපරි මිලෙන් පහත සඳහන් පරිදි අඩු කරන ලද මිල වන්නේය :—

| අඩංගු කර නොමැති උපකරණය | අඩු කළ යුතු මිල රු. ශ. |
|---|---|
| කවකටුව ... ... ... | 1 50 |
| බෙදන කටුව ... ... ... | 1 0 |
| කෝණ මානය ... ... ... | 0 50 |
| මිනිත චතුරශ්‍රය ... ... ... | 0 50 |
| කෝදුව ... ... ... | 0 20 |
| පැන්සල ... ... ... | 0 10 |
| මකනය ... ... ... | 0 10 |

9. ප්ලාස්ටික් පෙට්ටියක අහුරන ලද, ඝන කැට වාත්තුවෙන් යුත් බෙදන කටුව හා කොම්පාසුව සහිත '' මෙටැලික්ස් සුපර් '' නම් ගණිත උප කරණ කට්ටලයට මෙම නියෝගය අදාල නොවේ.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
නියෝජ්‍ය මිල පාලක (විවිධ ද්‍රව්‍ය).

1970 දෙසැම්බර් මස 11 දින,
කොළඹ දිය.

### උපලේඛනය

### ගණිත උපකරණ

| විස්තරය | එක් ගණිත උපකරණ පෙට්ටියක් සඳහා සිල්ලර වෙළෙන්දගේ උපරිම සිල්ලර මිල රු. ශ. |
|---|---|
| ගණිත උපකරණ සම්පූර්ණ කට්ටලයක් | 6 00 |

සටහන :

මෙම මිල ගණන් ඉහත සඳහන් උපකරණ විකිණිය යුතු නියම මිල නොවේ. ඒ වූ කලී විකිණීමේදී නො ඉක්මවිය යුතු උපරිම මිල වන්නේය.

12-714/2

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි